Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සතිය - සැප්.- 3

විෂය - ගිණුම්කරණය

ශ්‍රේණිය - 12

සකස් කළේ - මානෙල් ජයසූරිය මිය,ර/සුමනා බාලිකා විද්‍යාලය

**(1)** රෙදි පිළි අලෙවි සැලක් පවත්වාගෙන යන කළිඳු ව්‍යාපාරයේ පොත්වලින් 2020-03-31 දින උපුටා ගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

රු. ,000

| | හර | බැර |
|---|---|---|
| විකුණුම් | | 3 500 |
| ලද වට්ටම් | | 170 |
| ස්ථාවර තැන්පත් පොලී ආදායම් | | 100 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 450 |
| 12% බැංකු ණය | | 800 |
| ප්‍රාග්ධනය | | 6 185 |
| 2019-04-01 හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම | | 25 |
| 2019-04-01 දිනට සමුච්චිත ක්ෂය- | | |
| බෙදා හැරීමේ රථ | | 2 160 |
| ලීබඩු | | 260 |
| දේපල පිරියත උපකරණ පිරිවැය- | | |
| බෙදාහැරීමේ රථ | 7 200 | |
| ලී බඩු | 1 300 | |
| වේතන (ශුද්ධ) | 460 | |
| ගැණුම් | 1 100 | |
| ගෙන ඒමේ කුලී | 80 | |
| 2019-04-01 තොගය | 45 | |
| රක්ෂණ ගාස්තු | 120 | |
| දුන් වට්ටම් | 84 | |
| විදුලිය | 245 | |
| ගෙවල් කුලී | 150 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 926 | |
| 10% ස්ථාවර තැන්පත් | 1 500 | |
| මුදල් | 440 | |
| | 13 650 | 13 650 |

අතිරේක තොරතුරු

1. 2020-03-31 දිනට තිබූ තොගයේ පිරිවැය රු. 90 000 ක් වූ අතර එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 85 000 කි.
2. 2020-03-31 දිනට වැඩිපුර ගෙවන ලද රක්ෂණ ගාස්තුව රු. 20 000 කි.
3. ව්‍යාපාරය කුලියට ගත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර එක් මාසයකට ගෙවල් කුලිය රු. 25 000 ක් වේ.
4. සේවක දළ වැටුප මත සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේවක දායකය 8% ක්ද , සේව්‍ය දායකය 12% ක් ද වේ. සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවක දායකය අඩුකර වැටුප් ගෙවා ඇති අතර වෙනත් ගැලපීම් සිදු කර නැත.
5. වෙළඳ ලැබිය යුතු දෑ ශේෂයෙන් රු. 26 000 ක් බොල්ණය ලෙස කපා හැරිය යුතුයි. ඉතිරි ශේෂයෙන් 5% ක් හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීමක් සිදු කළ යුතුයි.
6. බෙදාහැරීමේ රථ 10% ක් ද, ලී බඩු 5% ක් ද, සරල මාර්ග ක්ෂය ක්‍රමය මත වාර්ෂිකව ක්ෂය කළ යුතුයි.
7. බැංකු ණය පොලිය උපචිතය.
8. ව්‍යාපාරයේ හිමිකරු රු. 60 000 ක භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රැගෙන ගොස් ඇත. කළමනාකරු රු. 20 000 ක භාණ්ඩ ළමා නිවාසයකට පරිත්‍යාග කර ඇත. මේ පිළිබඳව පොත්වල සටහන් තබා නැත.

අවශ්‍ය වන්නේ -

1. 2020-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය
2. 2020-03-31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය